# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1985/16 - 2016 සැප්තැම්බර් මස 20 වැනි අඟහරුවාදා - 2016.09.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර :*

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, නගර හා කඩවත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 244N අභයපුර ග්‍රාම සේවා වසමේ ත්‍රිකුණාමලය නගර හා කඩවත් සර්වේ ජනරාල් විසින් 2016.05.25 දිනැතිව පිළියෙල කරන ලද FVP 29 දරණ පිඹුරේ ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.5962 පමණ වූ කැබලි අංක 1823 දක්වා ඉඩමට මායිම් විස්තර පහත සඳහන් කර ඇත.

**කැබලි අංක 1823 — විස්තීරණ: හෙක් 2.5962**

*උතුරට*: කැබලි අංක 979, 34; *නැගෙනහිරට*: කැබලි අංක 34, 31; *දකුණට*: කැබලි අංක 31, 952, 951, 979, 950, 949: බටහිරට: කැබලි අංක 952, 951, 979, 950, 949, 979

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 නොවැම්බර් 03 වැනි දින පෙ. ව. 10.00 ට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2016 ඔක්තෝබර් මස 13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණනය කළ ආකාරයත් පිටපත් දෙකක් සහිතවූ ලියවිල්ලකින් මා වෙත ඉදිරිපත් කළ යුතුය.

ජේ. එස්. අරුල්රාජ්,
ප්‍රාදේශීය ලේකම්,
නගර හා කඩවත් කොට්ඨාසය,
ත්‍රිකුණාමලය.

2016 අගෝස්තු මස 31 වැනි දින,
ත්‍රිකුණාමලය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී ය,

10-42


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24242 - 36 - (2016/09)

## 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DIVKB/LND/LA/POSAQ/10.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 03J/89/PT/108.

කොබෙයිගනේ තැපැල් කාර්යාලය ඉදිකිරීම සඳහා අවශ්‍ය වන පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවින් 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:*

වයඹ පළාතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1301 කොබෙයිගනේ ග්‍රාම නිළධාරි වසමේ ඉහල කොබෙයිගනේ ගමේ, අවසන් ගම් පිඹුරු අංක 1648, අතිරේක අංක 21, පත්‍ර අංක 16හි

**කැබලි අංක 252—ඉඩමේ නම: කිඹුල් කොටුව — ඉඩමේ විස්තර: ගොඩ ඉඩම; — ඉඩම් ප්‍රමාණය: හෙක් 0.0733**

*උතුරට*: 34 සහ 251 වැනි බිම් කැබලි; *නැගෙනහිරට*: 251 සහ 31 වැනි බිම් කැබලි; *දකුණට*: 31 සහ 253 වැනි බිම් කැබලි: බටහිරට: 253 සහ 34 වැනි බිම් කැබලි.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2016 නොවැම්බර් මස 30 වැනි දින පෙ. ව. 10.00 ට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2016 නොවැම්බර් මස 23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

එන්. ඒ. ඒ. එස්. ප්‍රියංකර,
ප්‍රාදේශීය ලේකම්,
කොබෙයිගනේ.

කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10-43

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.